කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# පුරප්පාඩු
## පොල් පර්යේෂණ ආයතනය

පොල් පර්යේෂණ ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01.පර්යේෂණාත්මක නිලධාරි තනතුර

**වෘත්තිය සුදුසුකම් හා පළපුරුද්ද :**

- **බාහිර** : පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් විද්‍යාව / කෘෂිකර්මය/ වැවිලි කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.
- **අභ්‍යන්තර :** කළමනාකරණ සහකාර (තාක්ෂණික) කාණ්ඩයේ ශිල්පීය නිලධාරියෙකු ලෙස වසර 10 ක සතුටුදායක සේවයක් සපුරා තිබීම.
- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.
- **වැටුප් කාණ්ඩය** : MA 4
- **වැටුප් පරිමාණය** : රු. 37,970/-10x755/-15x930/-5x1,135/-65,145/-
- **ආරම්භක වැටුප් තලය** : රු. 37,970.00 - (2/2016 කා.සේ.චක්‍රලේඛය ප්‍රකාරව)
- **අනෙකුත් ප්‍රතිලාභ** :

මූලික වැටුපට අමතරව පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.

i. ජීවන වියදම් දීමනාව - රු.7800/-
ii. සන්නිවේදන දීමනාව
iii. තේ දීමනාව

## 02.කළමනාකරණ සහකාර (ලිපිකරු) තනතුර

**වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :**

- **බාහිර :**

  අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් භාෂාව (සිංහල / දෙමළ) , ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් සමග එකවර අවම වශයෙන් විෂයයන් 06 කින් සමත්වීම සහ අ.පො.ස (උ.පෙළ) එකවර විෂයයන් තුනකින් සමත්වීම.

  **සහ**

  පරිගණක දැනුම (උදා - Word Processing, Spreadsheet, Presentations)

  **සහ**

  පරිගණකය හා යතුරුලියනය භාවිතයෙන් ඉංග්‍රීසියෙන් යතුරු ලිවීමේ අවම වේගය විනාඩියකට පිළිවෙළින් 50 හා 40 විය යුතුය.

- **අභ්‍යන්තර :**

  පහත දැක්වෙන සුදුසුකම් ඇති ප්‍රාථමික මට්ටමේ ශිල්පීය (PL 3), ප්‍රාථමික මට්ටමේ අර්ධ ශිල්පීය(PL 2), ප්‍රාථමික මට්ටමේ ශිල්පීය නොවන (PL 1) සේවකයින් මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

  භාෂාව (සිංහල / දෙමළ) , ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව විෂයයන් 04 කට සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් එකවර විෂයයන් 06 කින් සමත් වීම.

  **සහ**

  ඉහත සඳහන් සේවා කාණ්ඩයේ ස්ථිර සේවයේ අවම වශයෙන් වසර පහක (05) සේවය.

  **සහ**

  පරිගණකය සහ යතුරුලියනය භාවිතයෙන් ඉංග්‍රීසියෙන් යතුරු ලිවීමේ අවම වේගය විනාඩියකට පිළිවෙළින් 50 හා 40 විය යුතුය.

- **සටහන :** සිංහල සහ දෙමළ භාෂාවෙන් යතුරු ලියනය කිරීම පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

- **වයස :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

- **වැටුප් කාණ්ඩය :** MA 1-2

- **වැටුප් පරිමාණය :** රු. 27,910/-10x300/-7x350/-12x600/-12x710/-49,080/-

- **ආරම්භක වැටුප් තලය :** රු.27,910.00 (2/2016 කා.සේ.චක්‍රලේඛය ප්‍රකාරව)

- **අනෙකුත් ප්‍රතිලාභ :**

මූලික වැටුපට අමතරව පහත සඳහන් මාසික දීමනා ද ගෙවනු ලැබේ.

i. ජීවන වියදම් දීමනාව - රු.7800/-
ii. තේ දීමනාව

## 03.කළමනාකරණ සහකාර (විගණන) තනතුර

**වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :**

- **බාහිර** : අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ, ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් සමග අවම වශයෙන් එකවර විෂයයන් 6 කින් සමත් වී තිබීම.

  **සහ**

  අ.පො.ස (උසස් පෙළ) වාණිජ විෂය ධාරාවෙන් ගණකාධිකරණ විෂයට සම්මාන සාමාර්ථය සහිතව එකවර විෂයයන් තුනකින් සමත් වීම.

  **සහ**

  පරිගණක පිළිබද දැනුම ( උදා - Word Processing , Spreadsheet. Presentation)

  **සටහන** : විගණනය පිළිබද ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් වනු ඇත.

- **අභ්‍යන්තර :** පහත දැක්වෙන සුදුසුකම් ඇති ප්‍රාථමික මට්ටමේ පුහුණු, ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු, ප්‍රාථමික මට්ටමේ නුපුහුණු සේවකයින් මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

  භාෂාව (සිංහල / දෙමළ), ඉංග්‍රීසි හා ගණිතය අතුළුව විෂයයන් 04 කට සම්මාන සහිතව අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය එකවර විෂයයන් 06 කින් සමත්වී තිබීම.

  **සහ**

  ඉහත සඳහන් සේවා කාණ්ඩයේ ස්ථිර සේවයේ අවම වශයෙන් වසර 05 ක සේවය.

  **සටහන** : MS Word සහ MS Excel පැකේජ මගින් වැඩ කිරිමේ හැකියාව අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

- **වැටුප් කාණ්ඩය** : MA 1-2

- **වැටුප් පරිමාණය** : රු. 27,910/-10x300/-7x350/-12x600/-12x710/-49,080/-

- **ආරම්භක වැටුප් තලය** : රු.27,910.00 (2/2016 කා.සේ. චක්‍රලේඛය ප්‍රකාරව)

- **අනෙකුත් ප්‍රතිලාභ** :

  මූලික වැටුපට අමතරව පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.

  i. ජීවන වියදම් දීමනාව - රු.7800/-

  ii. තේ දීමනාව

**<u>පොදු කොන්දේසි</u>**

1. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්කරු මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්වයකින් පසුවිය යුතුයි.
3. අයදුම්කරු දිවයින තුල ඕනෑම ස්ථානයක සේවය කිරීමට කැමති විය යුතුයි.

**<u>පොදු ප්‍රතිලාභ</u>**

1. 1983 අංක 12 දරණ පාරිතෝෂික දීමනා පනත යටතේ හා 2016.04.25 දිනැති අංක 2/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව පාරිතෝෂික ගෙවනු ලැබේ.
2. දායකත්ව වෛද්‍යාධාර යෝජනා ක්‍රමයට හිමිකම් ඇත.
3. අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල (අපේක්ෂකයන් විසින් වැටුපෙන් 10% ක් හා මණ්ඩලය විසින් 15% ක් අර්ථසාධක අරමුදල සඳහා සහ 3% ක් සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහාද දායක වනු ඇත.)
4. පොල් පර්යේෂණ ආයතනයේ සේවයකයින් හට ලැබෙන අනෙකුත් ප්‍රතිලාභද හිමිවනු ඇත

අයදුම්කරුවන් විසින් <u>උප්පැන්න සහ අනෙකුත් අදාළ සියළුම අධ්‍යාපන හා වෙනත් සහතිකපත් වල පිටපත් සහ චරිත සහතික දෙකක් (ඉන් එකක් ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය.), ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක ද සමග අයදුම්කරු විසින් **අත්සන් කරන ලද**</u> තම අයදුම්පත **2023/12/22** වන දින හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, පොල් පර්යේෂණ මණ්ඩලය, ලුණුවිල යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

ප්‍රමාද වී එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවය කරන අය තම අයදුම්පත් ඔවුන්ගේ අදාල ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පතේ පිටපතක් සෘජුවම එවිය හැකිය.

ලිපි කවරයේ වම්පස ඉහල කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

අදාල සහතිකවල පිටපත් නොමැතිව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කාරුණිකව සලකන්න.

**මේ පිළිබඳව බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.**

මෙම දැන්වීම පොල් පර්යේෂණ ආයතනයේ වෙබ් පිටුව වන www.cri.gov.lk මගින්ද බලා ගත හැක.

සභාපති
පොල් පර්යේෂණ මණ්ඩලය
ලුණුවිල